# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2070/29 - 2018 මැයි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ජෝන් ඇන්තනි ඉමැනුවෙල් අමරතුංග වන මම, 2005 අංක 38 දරන සංචාරක පනතේ 70 වන වගන්තිය යටතේ පැවරුණු බලතල යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක සංවර්ධන කාර්යයක් සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය බව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 49 (අ) වගන්තියට අනුකූලව මෙයින් නියම කරමි.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 2 ඒ, වරාහේන, ග්‍රාම නිලධාරි වසමේ වරාහේන ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අනුරේඛන අංක GA/BNT/2016/661 හි කැබලි අක්ෂර A, B, G, H මගින් දැක්වෙන පහත සඳහන් මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 11.8652 (අක්: 29 රූඩ්: 1 පර්: 9.11) පමණ වන ඉඩම්.

*උතුරට:* රොබොල්ගොඩ ගමෙහි කටුකුරුන්ද වත්ත, අලවතුගොඩ ගම; *නැගෙනහිරට:* අලවතුගොඩ ගම, අල්විස් මාවත;*දකුණට:* වරාහේන ගමෙහි බන්ඩාරවත්ත, ලුණුකැරුව සහ ලුණුකැරුවයාය; *බටහිරට:* කොළඹ - ගාල්ල මහා මාර්ගය;

**ජෝන් ඇන්තනි ඉමැනුවෙල් අමරතුංග**
සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

05-635

1A - G 27588- 17 (2018/05)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.